මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය
நிதி, பொருளாதார உறுதிப்பாடு மற்றும் தேசிய கொள்கைகள் அமைச்சு
MINISTRY OF FINANCE, ECONOMIC STABILIZATION & NATIONAL POLICIES

මහලේකම් කාර්යාලය, කොළඹ 01, ශ්‍රී ලංකාව.
செயலகம், கொழும்பு 01, இலங்கை.
The Secretariat, Colombo 01, Sri Lanka.

කාර්යාලය / அலுவலகம் / Office: 011 - 2484500, 011 - 2484600, 011 - 2484700
ෆැක්ස් / தொலைநகல் / Fax: 011 - 2449823
වෙබ් අඩවිය / இணையதளம் / Website: www.treasury.gov.lk

දිනය / திகதி / Date: 2022 – 08 - 08

# පුවත්පත් නිවේදනය

## රාජ්‍ය අංශයේ මානව සම්පත් සංවර්ධන ශිෂ්‍යත්ව වැඩසටහන සඳහා ජපන් රජයේ ආධාර

රාජ්‍ය අංශයේ විධායක ශ්‍රේණියේ නිලධාරීන්හට ජපානයේ පිළිගත් විශ්වවිද්‍යාලයන් හිදී පශ්චාත් උපාධි පාඨමාලාවන් හැදෑරීමේ අවස්ථාව ලබා දීම සඳහා 2010 වසරේදී ජපාන රජය විසින් මානව සම්පත් සංවර්ධන ශිෂ්‍යත්ව සඳහා වන ජපාන ආධාර වැඩසටහන ශ්‍රී ලංකාවට හඳුන්වා දෙන ලදි.

ඒ අනුව, මෙම වැඩසටහනෙහි පළමු කාර්යරාමුව (2010-2013), දෙවන කාර්යරාමුව (2014-2017) සහ තුන්වන කාර්යරාමුව (2018-2021) පිළිවෙළින් 2013, 2017 හා 2021 වසරවලදී සාර්ථකව අවසන් කරන ලදි. හතර වන කාර්යරාමුව (2022-2025), 2022 වසරේදී ආරම්භ කරන ලද අතර 2025 වසරේදී අවසන් කිරීමට නියමිතයි. තවද, මෙම වැඩසටහන යටතේ අධ්‍යයන කටයුතු අවසන් කරන ලද ශිෂ්‍යත්වලාභීන්ගේ වෘත්තීයමය සංවර්ධනය තවදුරටත් සිදුකිරීමේ අවශ්‍යතාවය සලකා බැලීමෙන් අනතුරුව ආචාර්ය උපාධි පාඨමාලාවන් හැදෑරීම සඳහා උපරිම වශයෙන් වාර්ෂිකව අවස්ථා දෙකක් පිරිනැමීමට ද ජපාන රජය එකඟත්වය පළකර ඇත. ඒ අනුව, මෙම වැඩසටහන යටතේ මේ දක්වා පශ්චාත් උපාධි පාඨමාලාවන් හැදෑරීම සඳහා අවස්ථා 195 (වසරකට 15 බැගින්) ක් හා ආචාර්ය උපාධි පාඨමාලාවන් හැදෑරීම සඳහා අවස්ථා 10 ක් ලබා දී ඇත.

හතරවන කාර්යරාමුවේ පළමු වන කණ්ඩායමෙහි තෝරා ගැනීමේ ක්‍රියාවලිය මේ වන විටත් අවසන් වී ඇති අතර තෝරා ගත් නිලධාරීන් 2022 සැප්තැම්බර් මස දී ඔවුන්ගේ අධ්‍යයන කටයුතු ආරම්භ කිරීමට නියමිතය. ජපාන රජය, 2010 වසරේ සිට JDS වැඩසටහනේ වියදම් සඳහා අවශ්‍ය ප්‍රදාන අරමුදල් වාර්ෂිකව සපයනු ලබන අතර ඒ අනුව, 2022 දී ජපාන යෙන් මිලියන 282 ක ආධාර (වර්තමාන විනිමය අනුපාතිකයට අනුව ආසන්න වශයෙන් රුපියල් මිලියන 761) ශ්‍රී ලංකාවට පිරිනැමීමට ද යෝජනා කර ඇත.

මෙම වැඩසටහන යටතේ ප්‍රතිලාභ ලබා ගන්නා රාජ්‍ය නිලධාරීන් මෙරට සමාජ හා ආර්ථික සංවර්ධනය සඳහා වඩාත් ඵලදායී ලෙස හා ආත්ම විශ්වාසයෙන් යුතුව සිය දායකත්වය ලබා දෙන අතර දෙරට අතර දැනට පවතින ද්විපාර්ශ්වික සම්බන්ධතා තවදුරටත් ශක්තිමත් කර ගැනීමටද මෙම වැඩසටහන මඟින් දායකත්වය ලබා දෙනු ඇතැයි ශ්‍රී ලංකා රජය අපේක්ෂා කරයි.

මෙම වැඩසටහන ක්‍රියාවට නැංවීම උදෙසා දෙරට අතර හුවමාරු පත්‍ර අත්සන් කිරීම හා ජපාන ජාත්‍යන්තර සහයෝගිතා ආයතනය සමඟ මුදල් ප්‍රදාන ගිවිසුමකට එළඹීම 2022.08.08 දින මුදල් අමාත්‍යාංශයේ දී සිදු කරන ලදී. ශ්‍රී ලංකා රජය වෙනුවෙන් මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ ලේකම් කේ එම් එම් සිරිවර්ධන මහතාද ජපාන රජය වෙනුවෙන් ශ්‍රී ලංකාවේ ජපාන තානාපති මිසුකොෂි මහතා හා ජපාන ජාත්‍යන්තර සහයෝගිතා ආයතනය වෙනුවෙන් එහි ප්‍රධාන නියෝජිත යමදා ටෙට්සුයා මහතා විසින් අදාළ ලියකියවිලිවලට අත්සන් තබන ලදී.

**මාධ්‍ය අංශය**